**බුද්ධශාසන අමාත්‍යාංශය**
**බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව** 023716

**ශ්‍රී බු. ව. 2561 - දහම් පාසල් ශ්‍රේණි විභාගය - 2017 නොවැම්බර් 26**

**6 ශ්‍රේණිය** විභාග අංකය :

කාලය : පැය 01

---

(I) කොටසේ ප්‍රශ්න සියල්ලටත් (II) කොටසින් තෝරාගත් ප්‍රශ්න අටකටත් (08) පමණක් පිළිතුරු සපයන්න.
(I) කොටසට ලකුණු (2 ×10) 20 කි. (II) කොටස සඳහා ලකුණු (10×08) 80 කි.

e - LEARNING HJ NETWORK
BEST HELPER FOR YOUR ONLINE LEARNING

## (I) කොටස

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. එක මවකගේ දරු පිරිසක් ලෙස සිතන - නෙක ගුණදම්වලින් සියදිවි සරු කරන
.................................................... - කටයුතු කරන පිරිසකි දෙලොවම දිනන
(i) සතියෙන් සතිය සිරිසදහම් රස විඳින (ii) පින්බර දේසයේ පින් සිතුවිලි පුරණ
(iii) සුපිපුණු වතු සුද්දමල් පොකුරක් ලෙසින (iv) දෙගුරුන් නමට කවදත් තම හිස නමන

02. "සටීකාර" නමැති බෞද්ධ උපාසක තුමා අග්‍රදායකයා වූයේ කිනම් බුදුරජාණන් වහන්සේගේ ද?
(i) කකුසඳ බුදුරජාණන් වහන්සේගේ ය. (ii) කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ය.
(iii) කෝණාගම බුදුරජාණන් වහන්සේගේ ය. (iv) ගෞතම බුදුරජාණන් වහන්සේගේ ය.

03. "ලෝකේ උස්සාහවන්තානං ජනානං කිමසාධියං" යන ප්‍රකාශය සිදුකරන ලද්දේ කිනම් රජතුමා විසින්ද?
(i) මහා විජයබාහු රජතුමා විසිනි. (ii) දෙවනපෑතිස් රජතුමා විසිනි.
(iii) මහා පරාක්‍රමබාහු රජතුමා විසිනි. (iv) දුටුගැමුණු රජතුමා විසිනි.

04. බුදුරජාණන් වහන්සේගේ ගුණ සිහි කරමින් සිදු කරන භාවනාව ...
(i) ආනාපාන සති භාවනාවයි. (ii) මෛත්‍රී භාවනාවයි.
(iii) අසුභ භාවනාවයි. (iv) බුද්ධානුස්සති භාවනාවයි.

05. ප්‍රථම ධර්ම සංගායනාවේ දී විනය සම්බන්ධ සියලු ප්‍රශ්න වලට පිළිතුරු ලබාදුන්නේ කවුරුන් විසින් ද?
(i) ආනන්ද මහරහතන් වහන්සේ විසිනි. (ii) උපාලි මහරහතන් වහන්සේ විසිනි.
(iii) මහාකාශ්‍යප මහරහතන් වහන්සේ විසිනි. (iv) රාහුල මහරහතන් වහන්සේ විසිනි.

06. ලෝවැඩ සඟරාව, ලෝකෝපකාරය හා සුභාෂිතය යන කාව්‍යකෘති හඳුන්වන්නේ.
(i) සන්දේශ කාව්‍යය ලෙසයි. (ii) උපදේශ කාව්‍යය ලෙසයි.
(iii) වීර කාව්‍යය ලෙසයි. (iv) ග්‍රාම්‍ය කාව්‍යය ලෙසයි.

07. බුදුරජාණන් වහන්සේ පටිච්ච සමුප්පාදය මෙනෙහි කළේ බුද්ධත්වයෙන් කීවැනි සතියේදී ද?
(i) පළමුවන සතියේ දී ය. (ii) දෙවන සතියේ දී ය.
(iii) සිව්වන සතියේ දී ය. (iv) පස්වන සතියේ දී ය.

08. පළමුවන ධර්ම සංගායනාව "පඤ්චසතිකා" යන නමින් හඳුන් වන්නේ කවර හේතුව නිසා ද?
(i) කරුණු 500ක් සංගායනා වූ නිසා ය. (ii) දින 500ක් පුරා පැවති නිසා ය.
(iii) රහතන් වහන්සේ 500 නමක් සහභාගි වූ නිසා ය. (iv) 500ක පිරිසක් උපස්ථාන කළ නිසා ය.

09. "අටදාගෙය" නමින් දළදා වහන්සේට මාලිගාවක් කරවූ රජතුමා කවුරු ද?

(i) මහා පරාක්‍රමබාහු රජතුමා ය. (ii) නිශ්ශංකමල්ල රජතුමා ය.

(iii) මහා විජයබාහු රජතුමා ය. (iv) දෙවන පැතිස් රජතුමා ය.

10. බෞද්ධ අපගේ අත්පොත "ධම්මපදය" යි. එහි ඇතුළත් ගාථා සංඛ්‍යාව කොපමණ ද?

(i) 423 කි. (ii) 363 කි.

(iii) 413 කි. (iv) 351 කි.

(2 ×10) ලකුණු 20 යි.

## (II) කොටස

**මෙම කොටසින් ප්‍රශ්න 08 කට පමණක් පිළිතුරු සපයන්න.**

01. නහි වේරේන වේරානි - සම්මන්තීධ කුදාචනං
අවේරේන ච සම්මන්ති - ඒස ධම්මෝ සනන්තනෝ. ....... මෙම ගාථාව දේශනා කිරීමට හේතු වූ කතා පුවත කෙටියෙන් ලියන්න. (ලකුණු 10 යි)

02. දේව ධර්ම ජාතකය අපට කියා දෙන ආදර්ශ මොනවා ද? (ලකුණු 10 යි)

03. ජය ශ්‍රී මහා බෝධීන්වහන්සේ උදෙසා වාර්ෂිකව සිදුකෙරෙන මංගල්‍ය අතුරින් එකක් වන අලුත් සහල් මංගල්‍යය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 10 යි)

04. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය නමින් හැඳින්වෙන්නේ කුමක් ද? (ලකුණු 10 යි)

05. වැලිවිට අසරණ සරණ සිරිසරණංකර සංඝරාජ මාහිමියන්ගේ චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ මොනවා ද ? (ලකුණු 10 යි)

06. ඔබේ නිවස හා ගෙවත්ත පිරිසිදුව තබා ගැනීමෙන් අත් වන ප්‍රයෝජන මොනවා ද? (ලකුණු 10 යි)

07. අප විසින් පොදු දේපොළ සුරැකිය යුත්තේ ඇයි දැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10 යි)

08. මල්, පලතුරු හා බෙහෙත් පූජා කිරීමෙන් ලැබිය හැකි අනුසස් පහක් නම්කරන්න. (ලකුණු 10 යි)

09. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව කුමක් ද ? එහි ඇතුළත් කරුණු මොනවා ද?

(ලකුණු 10 යි)

10. දස්සනකාමෝ සීලවතං - සද්ධම්මං සෝතුමිච්ඡති
විනෙය්‍ය මච්ඡේර මලං - සවේ සද්ධෝති වුච්චති.

මෙම ගාථාවෙන් කියැවෙන ශ්‍රද්ධාවන්තයාගේ ලක්ෂණ ලියා දක්වන්න. (ලකුණු 10 යි)

11. "දැඩි දුකක් නොවිඳ ලැබෙන සම්පත්තිය ඉතා අඩු වුවත් නුවණ ඇති අය අනුන් නසා ලබන සම්පත්තිය අශුචි මෙන් පිළිකුල් කරති" යන අර්ථය සඳහන් ලෝකෝපකාර පොතේ එන කවිය ලියන්න.

(ලකුණු 10 යි)

12. විනයධර භික්ෂූන්වහන්සේ අතර අගතනතුරට පත් උපාලි මහරහතන් වහන්සේ තමන්ට පැවරුණ වගකීම් මැනවින් ඉටුකළ අයුරු උදාහරණයකින් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

13. බුද්ධානුස්සති භාවනාව වැඩීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන මොනවා ද? (ලකුණු 10 යි)

14. අනාගත ජීවිතය සාර්ථක කරගැනීම සඳහා කුඩා කළ සිට ම ඔබ තුළ ගොඩනගා ගතයුතු යහපත් ගති ලක්ෂණ පහක් හඳුන්වා දෙන්න. (ලකුණු 10 යි)

15. බෞද්ධයකු තුළ තිබිය යුතු යහපත් ගුණාංග පහක් ලියන්න. (ලකුණු 10 යි)

බුද්ධශාසන අමාත්‍යාංශය
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව
ශ්‍රී බු. ව. 2561 - දහම් පාසල් ශ්‍රේණි විභාගය
2017 නොවැම්බර් 26

**06 ශ්‍රේණිය** **පිළිතුරු පත්‍රය**

(i) කොටසේ ප්‍රශ්න සියල්ලටත් (ii) කොටසින් තෝරාගත් ප්‍රශ්න අටකටත් පමණක් පිළිතුරු සපයන්න.
(i) කොටසට ලකුණු (2 × 10) 20 කි (ii) කොටස සඳහා ලකුණු (10 × 08) 80 කි.

මූලාශ්‍රය - 06 ශ්‍රේණිය පෙළ පොත

## i කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුර | පාඩම | පිටු අංකය | ඡේදය /ගාථාව /පාඨය | ලකුණු |
|---|---|---|---|---|---|
| 01 | (iii) සුපිපුණු චතු සුද්ද මල් පොකුරක් ලෙසින | 01 | 01 | 04 | 02 |
| 02 | (ii) කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ය. | 02 | 02 | 03 | 02 |
| 03 | (iii) මහා පරාක්‍රමබාහු රජතුමා විසිනි | 03 | 07 | 01 | 02 |
| 04 | (iv) බුද්ධානුස්සති භාවනාවයි. | 04 | 10 | 04 | 02 |
| 05 | (ii) උපාලි මහරහතන් වහන්සේ විසිනි. | 05 | 17 | 03 | 02 |
| 06 | (ii) උපදේශ කාව්‍ය ලෙසය. | 06 | 19 | 01 | 02 |
| 07 | (i) පළමුවන සතියේදී ය. | 08 | 27 | 02 | 02 |
| 08 | (iii) රහතන් වහන්සේ 500 නමක් සහභාගි වූ නිසා ය. | 09 | 32 | 02 | 02 |
| 09 | (iii) මහා විජයබාහු රජතුමා ය. | 12 | 47 | 01 | 02 |
| 10 | (i) 423 කි. | 13 | 50 | 02 | 02 |

## ii කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුර | පාඩම | පිටු අංකය | ඡේදය /ගාථාව /පාඨය | ලකුණු |
|---|---|---|---|---|---|
| 01 | මවයි පුතයි ජීවත් වූ පවුලක පුතාට තරුණියක විවාහ කරදීම, ඇයට දරුවන් නොලැබීම හේතුවෙන් ඇයගේ ද අභිමතය පරිදි තවත් තරුණියක කැඳවාගෙන ඒම, එම බිරිඳට දරුවකු ලැබෙන ලකුණු පහළ වීම. ඊර්ෂ්‍යා සහගත ද්වේෂ සිතින් පළමු බිරිඳ විසින් දෙවැන්නියගේ දරුවා විනාශ කිරීම, තෙවන වර දරුවා සමග මව ද මියයාම, මිය යන විට වෛරයෙන් මියයාම නිසා දෙදෙනාම සසරේ දිගු කලක් විවිධ සත්වයන් ව ඉපිද බුද්ධ කාලයේ දී එක් කාන්තාවක් මිනිස් කාන්තාවක් ලෙසත් අනිත් තැනැත්තිය කාලි නමින් යකින්නක් ලෙසත් ඉපදීම, මිනිස් කාන්තාවගේ දරුවන් දෙදෙනකුම විනාශ කිරීම, තෙවැනි දරුවා මරන්නට එද්දී ජේතවනාරාමයට ගෙන ගොස් පිහිට පැතීම, එහිදී ආත්ම ගණනාවක් දෙදෙනා කරගත් විනාශය පෙන්වා දෙමින් මෙම ගාථාව දේශනා කිරීම | 13 | 51-52 | 1-3 | 10 |
| 02 | එකමුතුව සමගිව ක්‍රියාකිරීම, විමසිලිමත්වීම, පව් කිරීමට බියවීම හා ලජ්ජාවීම, වැඩිහිටි අවවාද පිළිගැනීම, දූරදර්ශීව ක්‍රියා කිරීම, තැනට සුදුසු ලෙස කටයුතු කිරීම, නුවණැත්තන්ගේ අදහස්වලට බුද්ධිමත්ව සවන්දීම, විපතක් පැමිණි විට නුවණැතිව හා බුද්ධිමත්ව මුහුණ දීම. | 11 | 45 | 04 | 10 |
| 03 | දුරුතු පොහොය දා අලුත් සහල්වලින් සිදු කරනු ලබන පූජාවකි. යම් විටෙක අස්වනු නෙළීම පමාවුවහොත් නොපැසුණු වී කරල් ගෙන මිරිකා ගත් යුෂෙන් කිරිබත් සාදා පූජා කෙරේ. අලුත් අස්වැන්නෙන් ලබාගත් නොඉඳුල් සහලින් කිරිබත් පිසීම මෙහි ප්‍රධාන කාර්යය යි, සාමූහික ක්‍රියාවකි. රන් පාත්‍රයක බහාලූ මෙම කිරි ආහාර හේවිසි, හොරණෑ සහිත පෙරහැරකින් ශ්‍රී මහා බෝධීන් වහන්සේ වෙත වැඩම වනු ලැබේ. අනතුරුව විහාරයටත් බෝධීන් වහන්සේටත් පූජා කෙරේ. | 15 | 66 | 01 | 10 |
| 04 | ජාති, ජරා ආදි දුක් ඇතිවන්නේ තණ්හාව නිසා ය. මේ සියල්ල සම්පූර්ණයෙන් නැති වන්නේ තණ්හාව දුරු කළ විට ය. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය නමින් හැඳින්වෙන්නේ එය යි. | 17 | 74 | 01 | 10 |



E-LEARNING HJ NETWORK
BEST HELPER FOR YOUR ONLINE LEARNING

| | | | | | |
|---|---|---|---|---|---|
| 05 | සිල්වත්කම නිතර රැක ගැනීම, දුෂ්කරතා ඇතත් උනන්දුවෙන් ඉගෙනීම, අනුන්ට උපකාර කිරීම, අල්පේච්ඡ බව, ස්ථිර අධිෂ්ඨානයෙන් යුතුව කටයුතු කිරීම, අභියෝගවලට නොසැලී මුහුණ දීම, නිරහංකාර බව. | 18 | 76-78 | | 10 |
| 06 | වත්ත අලංකාර හා ප්‍රියමනාප වීම, ලෙඩ රෝග ඇතිවීම වැළකීම, මීයන්, කැරපොත්තන්, මදුරුවන් වැනි සතුන් බෝවීම පාලනය වීම, පරිසරය සුරැකී ආරක්ෂා වීම, සෞඛ්‍යමත් බව යනාදී කරුණු ඇතුළත් පිළිතුරක් අපේක්ෂිතයි. | 22 | 93-95 | | 10 |
| 07 | 23 පාඩම ඇසුරෙන් පොදු දේපොළ යනු මොනවා දැයි හඳුන්වා ඒවා සුරැකිය යුතු වන්නේ ඇයි දැයි පහදා දී තිබීම අපේක්ෂිතයි. | 23 | 96-98 | | 10 |
| 08 | සිරුර පැහැපත් වීම, උවදුරු දුරු වීම, නිරෝගී වීම, ආයු, වර්ණ, සැප, බල, නුවණ වැඩීම, පිරිස් බලය වැඩිවීම, සාගින්න, පිපාසය සංසිඳුවීම, ගරු බුහුමන් ලැබීම, ප්‍රිය මනාප පුද්ගලයකුවීම, කායික, මානසික, වාචසික සංවරය ඇති වීම, දෙව් මිනිස් සැප ලැබීම. | 25 | 105 | 01 | 10 |
| 09 | ධම්මචක්කප්පවත්තන සූත්‍රය - කාමසුඛල්ලිකානුයෝගය හා අත්තකිලමථානුයෝගය යන අන්ත දෙකෙහි ඇති අයහපත් බව, මධ්‍යම ප්‍රතිපදාවේ අගය, චතුරාර්ය සත්‍යය. | 08 | 29 | 01 | 10 |
| 10 | සිල්වතුන් දැකීම කැමැත්ත, නිතර දහම් ඇසීමට කැමැත්ත, මසුරු නැතිව දන් දීමට ඇති කැමැත්ත, සැදැහැ ගුණය ඇති බව | 07 | 24 | 01 | 10 |
| 11 | නිදුකින් සව් ඉසුරු - මදව ලැබෙතත් නුවණ ඇත්තෝ<br>අනුන් නසා ලබන - ඉසුරු සලකත් වසුරු අයුරින් | 06 | 19 | 02 | 10 |
| 12 | වරක මව මැරූ අයෙක් ද තවත් වරෙක පියා මැරූ අයෙක් ද ලජ්ජාවෙන් හා සමාජ ගර්හාවෙන් මිදීමට සිතා පැවිදි වීමට උත්සාහ කළ විට ඔවුන් පිළිබඳ තොරතුරු සොයා බලා වැරදිකරුවන් බව නිගමනය කිරීම, විනය නීතියක් පැනවීමට ද එය උපකාරී වීම, වරක් ජීවත්වීමට පහසු මගක් යයි සිතා හොරෙන් සිවුරු ඇඳ පැවිදි වෙස් ගත් තරුණයකුගේ සැබෑ තත්ත්වය හෙළි කොට දැක්වීම, පැවිදි වූ කුමාර කාශ්‍යප මාතාවගේ දරුගැබ පැවිදි වීමට පෙර ඇතිවූවක් බවට විශාඛා උපාසිකාව ලවා නිගමනය කරවීම, ප්‍රථම ධර්ම සංගායනාවේ දී විනය සම්බන්ධ සියලු පැන විසඳීම, | 05 | 16-17 | 06 | 10 |
| 13 | බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගෞරවය හා ශ්‍රද්ධාව වැඩි වීම, නුවණ දියුණුවීම, සතුට ඇති වීම, ගරු සැලකිලි ලබන අයකු වීම, නපුරු සිහින නොපෙනීම, බිය හා දුක් පීඩා ඉවසිය හැකි වීම, සුව සේ අවදි විය හැකි වීම, පාඩම් කිරීමට පහසු වීම, නරක සිතිවිලි යටපත් වීම, මරණින් මතු සුගතිගාමී වීම. | 04 | 10<br>11 | 06<br>01 | 10 |
| 14 | ආත්ම විශ්වාසය, අලසකම, කුසීත කම බැහැර කිරීම, අභියෝගවලට මුහුණදීම, ශ්‍රේෂ්ඨ චරිත ආදර්ශයට ගැනීම, උත්සාහවන්ත බව, කුසලතා වර්ධනය කරගැනීම, කලයුතු දෙය කිරීම, අවංකවීම, යථාවාදී තථාකාරී බව, අවවාද අනුශාසනා පිළිගැනීම, විවේකය අර්ථවත්ව ගත කිරීම, වැඩිහිටියන්ට ගරු කිරීම | 03 | 6-8 | | 10 |
| 15 | 1.තුනුරුවන් කෙරෙහි පැහැදීම. (කල නොකිරීම) 2. පන්සිල් රැකීම. 3. ලද දෙයින් සතුටුවීම. 4. දෙමාපියන්ට සැලකීම. 5.කලගුණ සැලකීම 6.සරල ජීවිතයක් ගත කිරීම, 7. තමන් හොඳ වැඩ කරන අතර අන් අයත් හොඳ වැඩවලට පිනට දහමට යොමු කරවා ගැනීමට උත්සාහ කිරීම,8. සිල්වත්කම, 9.මම, මගේ යන හැඟීමෙන් බැහැරව කටයුතු කිරීම | 13 | 51 | | 10 |

e-LEARNING
HJ NETWORK
BEST HELPER FOR YOUR ONLINE LEARNING